(29)


# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
## கூட்டுறவு அபிவிருத்தி திணைக்களம்
## DEPARTMENT OF CO-OPERATIVE DEVELOPMENT

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2478373, 011-2478374, 011-2478376

තැ.පෙ.419, අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02
த.பெ. இல. 419, இல. 330, யூனியன் பிளேஸ், கொழும்பு 02
P.O.Box 419, No. 330, Union Place, Colombo 02

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2478386, 011-2478377

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: info@coop.gov.lk, depcoopdev@gmail.com

වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.coop.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: ස.සං.දෙ/බැංකු/2/4

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2021.07. 19

**චක්‍රලේඛ - බැ/නි/ඒ/2021/04**

සියලුම මුදුන් මට්ටමේ සමුපකාර සමිති සහ
සංගම් වල ගරු සභාපතිවරුන් වෙත,

**විවිධ සේවා සමුපකාර සමිති හා මූල්‍ය සේවා ව්‍යාපාර කටයුතු සිදුකරන සියලුම ප්‍රාථමික සමුපකාර සමිති සහ සමුපකාර සංගම් විසින් සිය සාමාජිකයන් වෙත ප්‍රදානිත ණය පහසුකම් ප්‍රතිව්‍යුහකරණය සහ ප්‍රතිලේඛන ගත කිරිම.**

**01.** හැඳින්වීම.

මෙම චක්‍රලේඛයේ උපදෙස් සහ මඟපෙන්වීම්වල අරමුණු වන්නේ සමුපකාර මූල්‍ය සේවා සමිති විසින් තම සාමාජිකයන්ට සහ ආශ්‍රිත සාමාජිකයන්ට ලබා දී, දැනට අක්‍රමික ගණයේ පවත්නා සහ හිඟ ණය වාරික සහිත ප්‍රවර්තන ණය මුදල් පිළිබඳව ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව මඟපෙන්වීම් සම්පාදනය කිරීම වේ.

**02.** **ණය අය කිරීමේ අවශ්‍යතාව සහ වැදගත්කම.**

- සමුපකාර සමිති විසින් ණය මුදල් ප්‍රදානය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් උපයෝජනය කර ගනු ලබන්නේ සාමාජික සහ සාමාජික නොවන තැන්පතු වන හෙයින්, තැන්පත්කරුවන්ගේ වගකීම් පියවීම පිණිස ප්‍රමාණවත් වූ ද්‍රවශීලතාවක් පවත්වාගෙන යාම.
- ප්‍රදානිත ණය ක්‍රමිකව අයකිරීම තුළින් නැවත ණය ලබාදීම සඳහා / චක්‍රීයකරණය සඳහා අරමුදල් සම්පාදනය.
- ණය වාරික සහ පොළිය අයකර ගැනීමෙන් සමිතියේ ලාභදායිත්වය, තිරසාරත්වය සහ අඛණ්ඩ පැවැත්ම තහවුරු වීම.
- අය නොවන ණය සඳහා බොල් සහ අඩමාණ ණය වෙන් කිරීමට සිදුවීමෙන් ආයතනයන් හි ලාභදායිත්වය පහත වැටීම.
- සමිති / සංගම් / ග්‍රාමීය බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව පවත්වාගෙන යාම.
- සමිතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සත්‍ය සහ සාධාරණභාවය (True & Fair) පිළිබිඹු වීම.

- සමිති / සංගම් / ග්‍රාමීය බැංකු අංශයේ යහපත් ශ්‍රේණි තත්ත්වයක් පවත්වාගෙන යාම.
- සමිතියේ දිරිගැන්වීම් දීමනා, ප්‍රසාද දීමනා ආදිය ගෙවීමට හැකි මූල්‍ය ස්ථාවර තත්වයක් තහවුරු කර ගැනීම.
- ණයලාභී සාමාජිකයන්ට අනාගත මූල්‍ය අවශ්‍යතා සඳහා නැවත ණය ලබාදීම තුළින්, තරඟකාරී මූල්‍ය වෙළෙඳපොල තුළ ගණුදෙනුකරුවන් සමිතිය වෙත අඛන්ඩව රඳවා ගැනීම.
- සමිතියේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම්වල ගුණාත්මකභාවය රැකගැනීම.
- සංතෘප්තිමත් ගනුදෙනු ප්‍රජාවක් ඇති කිරීම.

## 03. ණය අය කිරීමේ ක්‍රමවේදය (පූර්ව කටයුතු)

- ණය ලාභින්ගේ ණය ගෙවීමට ඇති කැමැත්ත හෙවත් චරිතය (character) සහ ණය ගෙවීමේ හැකියාව (Capacity) හඳුනාගෙන කටයුතු කර ගෙන ණය ප්‍රදානය කිරීම.
- ණය අනුමත කිරීමට ප්‍රථම ණයලාභීන්ගේ සංඛ්‍යාත්මක තොරතුරු (ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම්) සහ ගුණාත්මක තොරතුරු (චරිතය) හා සම්බන්ධ දත්ත සහ තොරතුරු නිවැරදිව ලබා ගැනීම.
- වැරදි තෝරා ගැනීමේ උවදුර (Adverse Selection Hazard ) වළක්වා ගැනීම.
- හැකි සෑමවිටම අනර්ඝ සුරැකුම් මඟින් ණය මුදල්වල අවදානම අවම කර ගැනීම.
- ණය අවදානම, සංකේන්ද්‍රණ අවදානම, වෙළෙඳපොල අවදානම, ආදී ව්‍යාපාරික අවදානම් හඳුනාගෙන ඒවා කළමනාකරණය පිණිස සුදුසු උපායමාර්ග ගැනීම.
- ණය ප්‍රදානයේ දී සිදුවන අවිධිමත් පරිචයන් වළක්වාගැනීම/ බාහිර බලපෑම් (අධ්‍යක්ෂකවරුන්, සේවකයන්, දේශපාලන අවශ්‍යතා) මත ණය ලබාදීම සහ එසේ බලපෑම් කළ පාර්ශවයන්ගේ ණය මුදල් අය කර දීමේ වගකීම් පැහැර හැරීම. උදාහරණයක් ලෙස එක්තරා ග්‍රාමීය බැංකුවක අක්‍රමික ණය විශාල ප්‍රමාණයක් හඳුන්වා දී තිබුණු අධ්‍යක්ෂවරුන් පසුව ඒවා අක්‍රමික ගණයටම මාරු කළ විට අයකර දීමට ණයකරුවන් උනන්දු කරවීමට පියවර නොගැනීම පෙන්වා දිය හැකිය.
- ආපසු ගෙවීමේ හැකියාව සහ ණය මුදල් යොදවන අවශ්‍යතාව නිවැරදිව අවබෝධ කර නොගෙන වගකීමේ හැඟීමකින් තොරව ණය ලබා දීම.
- ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) හි අක්‍රමික ණය පිළිබඳ ව අයහපත් සටහන් සහිත පාර්ශවයන්, එම තොරතුරු වසන් කර , සමුපකාර සමිතියට එවැනි අයහපත් ණයකරුවන් පිළිබඳව හඳුනා ගත් ක්‍රමවේදයක් නොමැති හෙයින් නුසුදුසු පාර්ශවයන්ගේ ණය අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම.
- ණය අවදානම අධික වූ ණය අනුමත කරනු ලැබූ සහ නිර්දේශ කරන ලද නිලධාරීන් හඳුනා ගැනීම.
- අයහපත් ණය ක්‍රමෝපායන්ට සම්බන්ධ සේවකයින්ගේ වංචනික ක්‍රියා වළක්වා ගනිමින් මනා ඇගයීමකින් සහ අවධානයකින් යුක්තව ණය මුදල් අනුමත කිරීම.

## 04.ණය අය කිරීමේ ක්‍රමවේදය (පසු කටයුතු)

- දිනය, වාරික ගෙවිය යුතු ආකාරය (වාරිකය, පොළිය වෙන් වශයෙන්) ආදිය සඳහන් කර ණයකරුට ලිපියක් භාරදිය යුතුවීම.

උදාහරණ -

සම වාරික ක්‍රමය(EMT-Equated Monthly Installment )

- ණය මුදල - රු. 500, 000
- පොළිය - වාර්ෂිකව 16% බැගින්
- ගෙවිය යුතු දිනය - මාසයේ 15 වන දින
- කාලය - අවුරුදු 05
- ණය නිකුත්කල දින - 2019. ජනවාරි 01

| කාලය | ණය ගෙවීම් මුදල | පොළිය | සමුච්චිත පොළිය | ණය වාරිකය | සමුච්චිත ණය වාරිකය | ණය ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | | | | 500,000.00 |
| 1 | 12,159.03 | 6,666.67 | 6,666.67 | 5,492.36 | 5,492.36 | 494,507.64 |
| 2 | 12,159.03 | 6,593.44 | 13,260.10 | 5,565.59 | 11,057.96 | 488,942.04 |

හීනවන ශේෂ ක්‍රමය (Diminishing Installment Method )

- ණය මුදල - රු. 500,000
- පොළිය - වාර්ෂිකව 16% බැගින්
- ගෙවිය යුතු දිනය - මාසයේ 15 වන දින
- කාලය - අවුරුදු 05
- ණය නිකුත්කල දින - 2019 ජනවාරි 01

| කාලය | ණය ගෙවීම් මුදල | පොළිය | සමුච්චිත පොළිය | ණය වාරිකය | සමුච්චිත ණය වාරිකය | ණය ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | | | | | 500,000.00 |
| 1 | 15,127.85 | 6,794.52 | 6,794.52 | 8,333.33 | 8,333.33 | 491,666.67 |
| 2 | 14,368.03 | 6,034.70 | 12,829.22 | 8,333.33 | 16,666.66 | 483,333.34 |

- ❖ වාරිකය ගෙවිය යුතු දිනට දින 7කට පෙර ණයකරුගේ දුරකථන අංකයට කෙටි පණිවිඩයක් / හෝ දුරකථන ඇමතුමක් ගෙන මතක් කිරීම සුදුසු වේ.
- ❖ විද්‍යුත් තැපැල මඟින් සහ දුරකථනයෙන් සංනිවේදනය කිරීම (ණය මුදල ප්‍රදානය කිරීමේදී අනිවාර්යෙන් දුරකථන අංකය හා විද්‍යුත් තැපැල් ලිපිනයක් තිබේනම් එයද ලබා ගැනීම සුදුසුය.)
- ❖ ඉහත ක්‍රියාමාර්ගයන් සඳහා සතුටුදායක ප්‍රතිචාර නොමැති නම් ණයකරුට ලිඛිතව දැන්වීම් කළ යුතු අතර ණයකරු හඳුන්වා දුන් පාර්ශවයට ලිඛිතව දැනුවත් කළ යුතු ය.

## 05.අක්‍රමික ණය අයකර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු ක්‍රමවේදයන්

- ❖ සමිති විසින්, දැනටමත් දෙපාර්තමේන්තු විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස්වලට අනුව අක්‍රමික ණය මුදල් හඳුනා ගෙන අක්‍රමික ගණයට මාරු කර බොල් හා අඩමාණ ණය වෙන් කිරීම සිදු කිරීම.

- ❖ තීරකකරණයට යොමු කිරීම සහ අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබීම මත වෙන් කිරීම් සිදු නොකරන අවස්ථා වාර්තා වී ඇත. ණය ප්‍රදානය කෙරෙනුයේ සාමාජික සහ සාමාජික නොවන තැන්පත් අරමුදල් මූලශ්‍රයන් උපයෝගී කරගෙන වන බැවින් නෛතික ක්‍රියාමාර්ගවලින් ණය මුදල් අය වී මුදල් ලැබෙන තෙක් තැන්පත්කරුවන්ට සිය මුදල් ආපසු ලබාගැනීමට බලා සිටිය නොහැකිය. මෙම තත්ත්වය කළමනාකාරීත්වයෙන් අවබෝධ කර දී ප්‍රදානිත ණය මුදල් සඵලදායීව අයකර ගැනීම කළ යුතු ය. නීතිමය ක්‍රියාමාර්ග ගත්තද සත්‍ය වශයෙන්ම ණය මුදල අය වන තෙක් මෙම වෙන් කිරීම සිදු කළ යුතු ය.

ණය මුදල් ආපසු නොගවීමට ප්‍රධාන කරුණු දෙකක් බලපෑ හැකි ය.

(අ) සිතාමතා හෝ වංචනිකව ණය ආපසු ගෙවීම පැහැර හැරීම (Willful)
මෙම වර්ගයේ ණයකරුවන් හඳුනා ගෙන ණය මුදල් පිළිබඳව දැඩි අය කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනයකල යුතු ය. එවැනි ණය බොහොමයක් අක්‍රමික ණය වන අතර තවදුරටත් අයකර ගැනීම දුෂ්කර වියහැකිය. එබැවින් ඒවා සමුපකාර සමිති පනතේ 58 වගන්තිය ප්‍රකාරව ආරවුල් බේරුම්කරණයට යොමු කිරීමට කටයුතුකල යුතු ය.

(ආ) ණයකරුවන්ගේ පාලනයෙන් තොර හේතූන් නිසා අහිංසකව (Innocent) ණය නොගෙවීම.
එහෙත් මෙම වර්ගයේ ණය මුදල් සඳහා ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් අයුරු ක්‍රියා කළ හැකිය.

- ණය ප්‍රතිලේඛනය කිරීම. (Re-Scheduling)
- ණය ප්‍රතිව්‍යුහගත කිරීම. (Re-Structuring)

## 06.ණය ප්‍රතිලේඛනගත (Re-scheduling) කිරීමේ ක්‍රියා පිළිවෙල.

- ❖ ප්‍රථමයෙන් සිතාමතා පැහැර හරින ලද පාර්ශවයක් නොවන බව අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීම පිණිස ණයකරු විසිත්ත කිරීම සිදුකල යුතු ය. මෙහිදී අක්‍රමික ගණයේ පවතින ණය මුදල් පමණක් ප්‍රතිලේඛනගත කරනු ලැබේ. සමරූපී ක්‍රමයක් නොමැති අතර එක් එක් යෝජනාව අනුව (Case by Case) කටයුතු කළ යුතුය. ණයවාරික ගෙවීමට සත්‍ය උත්සහයක් සහ ඕනෑකමක් ඇති බව නිලධාරින්ට තහවුරුවිය යුතු ය.
- ❖ ණයකරුවන්ගේ ආදායම් තත්ත්වය හොඳින් අධ්‍යයනය කිරීම (ව්‍යාජ ඉල්ලීම්වලට නොරැවටීම, විචක්ෂණශීලිව කටයුතු කිරීම.)
- ❖ ඔහුගේ / ඇයගේ ප්‍රවර්තන වත්කම්, වගකීම් සහ ආදායම් සහ වියදම් සියුම්ව පරීක්ෂා කිරීම. මුදල් ප්‍රවාහයේ තත්ත්වය අවබෝධ කර ගැනීම.
- ❖ ණය මුදල අවභාවිතා කර තිබේ ද යන්න හඳුනා ගැනීම.

(27)

- ඉහත නිර්ණායකයන් අනුව ණයකරු සිතාමතා ණය පැහැර හරින්නෙකු නොවන නිර්ව්‍යාජ පාර්ශවයක් ද යන්න තහවුරු කර ගැනීම.
- ඔහුගේ වත්මන් මුදල් තත්ත්වය අනුව එකවර ගෙවිය හැකි තොග ගෙවීමක් (Lump-sum payment) වශයෙන් ගෙවිය හැකි පාර්ශවයක් ද යන්න තහවුරු කර ගැනීම.
- ණය ප්‍රතිලේඛනගත කිරීම සඳහා කොන්දේසි අන්තර්ගත යෝජනා ණයකරුවන්ගෙන් ලබාගැනීම. (ඇමුණුම 01)
- ප්‍රතිලේඛනගත කිරීමේ අවශ්‍යතාව සහ යෝජනාවේ සත්‍යතාව අධ්‍යයනය කිරීම සඳහා සමිතිය / ග්‍රාමීය බැංකුවේ නිළධාරියෙක් විසින් විධිමත් පරීක්ෂණයක් සිදුකළ යුතුය. (ඇමුණුම 06)
- සමිතිය / ග්‍රාමීය බැංකුව විසින් එම යෝජනා පිළිබඳව ණයකරුවන් සමඟ සාකච්ඡා කර කොන්දේසි පිළිබඳව එකඟතාවයකට පැමිණ ලිඛිතව ලබාගැනීම.
- අවශ්‍ය නම් එක්රැස් වූ පොළිය සඳහා සාධාරණ අනුපාතයන්ට හෝ පොළී රහිතව කෙටිකාලීන ණයක් ලබා දීමට සළකා බැලීම හෝ පොළී රහිතව දෙපාර්ශවය එකඟ වන කාලයක් තුල අයවිය යුතු අක්‍රමික ණය පොළිය ලෙස ගෙවීමට අවස්ථාව ලබාදීමට හැකිය. එහිදී අයවිය යුතු අක්‍රමික ණය පොළිය පිළිබඳ සියලුම කොන්දේසි ප්‍රතිලේඛනගත ගිවිසුමට ඇතුලත්කර ගත යුතු ය. කෙටිකාලීන ණය මුදලක් ලබා දෙන්නේ නම්, ඒ සඳහා සමිතියේ / ග්‍රාමීය බැංකුවේ සාමාන්‍ය ණය ක්‍රියාවලිය අනුගමනයකළ යුතු ය.
- ව්‍යාපාරයක් හෝ ව්‍යාපෘතියක් නම් එය ගිලන්වීමට බලපාන සත්‍ය හේතු සාධක අවබෝධ කර ගැනීම.
- දෙපාර්ශවය එකඟ වන කාලයක් සඳහා ණය ගෙවීමේ කාලය දීර්ඝ කිරීම.
- වාර්ෂික පොළී ප්‍රතිශතය පිළිබඳ තිරණය කිරීම.
- ප්‍රතිලේඛන යෝජනාවක් සකස් කර කාරක සභාව / අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු අතර ණය මුදල ඉක්මවා පොළිය අය වීමට ඇතිවිට ණය මුදලට සමාන වන පොළියක් තීරණය කිරීම කාරක සභාව / අධ්‍යක්ෂ මණ්ඩලය කළ යුතු ය. (ඇමුණුම 02)
- මුල් ණය ගිවිසුමට හානි නොවන ආකාරයට විශේෂ ගිවිසුමක් / එකඟතා ලිපියක් බැංකුව සහ ගණුදෙනුකරු අත්සන් කළ යුතු ය. (ඇමුණුම 03)
- ප්‍රතිලේඛන ගත කළ ණය මුදල් වාරික මාස හයක් නොකඩවා ගෙවා නිමකරන තෙක් නව ණය ආපසු ලබා නොදිය යුතු ය.
- පහත සඳහන් වෙනස්කම් ණය ගිවිසුමට සිදු කළ යුතු වනු ඇත.
  - I. පොළී අනුපාතය
  - II. කාලය - ප්‍රයෝගික වීම අවශ්‍යය.
  - III. සුරකුම්
  - IV. කොන්දේසි
- ප්‍රතිලේඛන ගත කළ යුතු ආපසු ගෙවීම් පිළිබඳව නිරන්තරයෙන් පසුවිපරම් කිරීම සිදුකල යුතුය.
- එසේම ණයකරු සමඟ අඛණ්ඩව සබඳතා පවත්වා ගැනීමද අත්‍යාවශ්‍ය වේ.

පොදු ලෙජර් ගිණුම් වල සටහන් කළ යුතු ආකාරය

❖ අක්‍රමික ණයෙහි එක්රැස් වූ පොළිය පහත පරිදි ගිණුම් ගතකල යුතු ය.

අක්‍රමික ණය සඳහා එක් රැස්වූ අයවිය යුතු පොලී ගිණුම හර

අක්‍රමික ණය සඳහා අවිනිශ්චිත පොළී ගිණුම බැර

ඉහත අයවිය යුතු අක්‍රමික ණය පොළිය එක් එක් ණයහිමියා නමින් වෙන් වූ ලෙජර් පත්‍රිකා පවත්වාගෙන යාම හෝ පරිගනක පද්ධති වේ නම් වෙන් වෙන්ව ලෙජර් ගිනුම් සකස් කිරීම මගින් සටහන් පැනවිය යුතුය. මෙහිදී අයවිය යුතු අක්‍රමික ණය පොළිය වෙනත් මූල්‍ය වත්කමක් ලෙසත් අවිනිශ්චිත පොළිය වෙනත් මූල්‍ය වගකීමක් ලෙසත් ගිණුම්වල සටහන්කල යුතු වේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගිණුම් සටහන්වල අයවිය යුතු අක්‍රමික ණය පොළියෙන් අවිනිශ්චිත පොළිය අඩුකර දැක්විය යුතු ය. මීලඟ වර්ෂයේ එම ගිණුම් පොදු ලෙජරයේ ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගෙන යා යුතු ය.

❖ අක්‍රමික ණය පොළිය අයවීමේදී ,පහත සඳහන් පිවිසුම් පැනවිය යුතුය ,

මුදල් ගිණුම හර

අයවිය යුතු අක්‍රමික ණය පොළි ගිණුම බැර

❖ අවිනිශ්චිත පොළිය, ආදායම් ලෙස පිවිසුම් පැනවීමේදී පහත පරිදි පැනවිය යුතුය,

අවිනිශ්චිත පොළී ගිණුම හර

අක්‍රමික ණය සඳහා ලද පොළී ගිණුම බැර

දැනට අක්‍රමික ණයක් ලෙස හඳුනාගෙන ඇති ණය මුදලක් ප්‍රතිලේඛණ ගතකර ඇති විටදී, එය තවදුරටත් අක්‍රමික ණය මුදලක් ලෙසම සැලකීම සිදුකල යුතු ය. එය ප්‍රවර්තන ණයක් ලෙස වර්ග කිරීම සිදුකල හැක්කේ අදාල ප්‍රතිලේඛණ ගත කොන්දේසි යටතේ ණය වාරික ගෙවීම අඛණ්ඩව මාස හයක් සිදුකිරීමෙන් අනතුරුවය.

ප්‍රතිලේඛණ ගත කොන්දේසි යටතේ ණය වාරික ගෙවීම අඛණ්ඩව හය මසක් සිදුකල විට අක්‍රමික ණය ගිණුමෙන් ප්‍රවර්තන ණය ගිණුමට මාරුකළ යුතු ය .මේ සඳහා ණයකරු ගෙන් ලිඛිතව ඉල්ලීමක් ලබා ගත යුතු වේ.එම ලිඛිත ඉල්ලීම තුළ එක වාරිකයක් හෝ හිඟ වුවහොත් ණය මුදල නැවත අක්‍රමික ගණයට මාරු කෙරෙන බව තමා හොඳින් දන්නා බවට සඳහන් විය යුතු ය. බොල් හා අඩමාණ ණය වෙන් කිරීම සඳහා ද පහත සඳහන් පරිදි සටහන් පැනවිය යුතු වේ.

❖ අක්‍රමික ණය ගිණුමෙන් ප්‍රවර්තන ණය ගිණුමට මාරුකිරීමේදී,

උදාහරණ -

කෙටි කාලීන ප්‍රවර්තන ණය ගිණුම හර

කෙටි කාලීන අවප්‍රමිත ණය ගිණුම බැර

මේ ආකාරයට සැකසහිත ණය හා හානි වූ / පාඩු වූ ණයද මාරුකළ යුතු ය.

❖ බොල් සහ අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුම් සඳහා ප්‍රති සටහන් පැනවන ආකාරය,

උදාහරණ -

කෙටි කාලීන අවප්‍රමිත බොල් හා අඩමාණ ණය වෙන් කිරීමේ ගිණුම හර

කෙටි කාලීන අවප්‍රමිත බොල් හා අඩමාණ ණය පොලී ආදායම් ගිණුම බැර

මේ ආකාරයට සැක සහිත බොල් හා අඩමාණ ණය හා හානි වූ / පාඩු වූ බොල් හා අඩමාණ ණයද මාරුකළ හැකිය.

## 07. ණය ප්‍රතිව්‍යුහකරණය (Restructuring) කිරීමේ ක්‍රියා පිළිවෙල.

❖ ණය මුදලක් ප්‍රදානය කිරීමෙන් අනතුරුව ස්වල්ප කාලයකට පසුව ණයකරුගේ ආදයම් මූලාශ්‍ර සහ මුදල් ප්‍රවාහයේ සිදු වන වෙනස්කම හේතුවෙන් වාරික සහ පොළිය ආපසු ගෙවීම් අපහසුතා හට ගැන්වීම නිසා මෙවැනි සහන ප්‍රතිකර්ම ඉල්ලීම් ඉදිරිපත්වීම සිදුවිය හැකිය.

❖ ප්‍රතිව්‍යුහකරණයේ අවශ්‍යතාවය සහ ගනුදෙනුකරුගේ යෝජනාව ලිඛිතව ලබා ගත යුතු ය. මෙහිදී ණය මුදල අනිවාර්යෙන්ම ක්‍රමික ගණයේ තිබිය යුතුය. (ඇමුණුම 04)

❖ එසේම ණයකරු සිතාමතා ණය ගෙවීම පැහැරහරින අයෙකු නොවිය යුතු ය.

❖ පවුලේ සෙසු සාමාජිකයන්ද අක්‍රමික ගණයේ ණයකරුවන් වන්නේ නම් ප්‍රවේශම් සහගතව කටයුතු කළ යුතු ය. ඇතැම් පාර්ශවයන් අතර ණය නොගෙවීමේ සංස්කෘතියක් ඇතිවීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. (Default Culture)

❖ ණය මුදලේ හිඟ වාරික ගණන හයකට අඩු විය යුතු ය.

❖ සමුච්චිත පොළිය ගෙවා නිම කළ යුතු ය.

❖ ණය වාරික හිඟවීම ණයකරුගේ පාලනයෙන් තොර වූ සාධක නිසා වීම අවශ්‍ය ය.

❖ ප්‍රතිව්‍යුහකරණය බැංකුවේ ණය ප්‍රතිපත්තියට සහ චක්‍රලේඛවලට අනුකූල විය යුතු අතර සෙසු ප්‍රජාව අතර අයහපත් පූර්වාදර්ශනයන් නිර්මාණය නොවන ආකාරයෙන් විය යුතු ය.

❖ ප්‍රතිව්‍යුහකරණය කළ කාල සීමාව දීර්ඝ කරන කාලය තුල පොළිය හිඟ නොමැතිව ගෙවිය යුතු ය.

❖ ප්‍රතිව්‍යුහකරණය කළ යුතු ණය, හිඟ වාරික නොමැතිව ගෙවිය යුතු අතර ඒ බව අධීක්ෂණය කර තහවුරු කරගත යුතු ය.

❖ ප්‍රතිව්‍යුහකරණය කිරීමේ අවශ්‍යතාව සහ යෝජනාවේ සත්‍යතාව අධ්‍යයනය කිරීම සඳහා සමිතියේ / ග්‍රාමීය බැංකුවේ නිලධාරියෙක් විසින් විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතු ය. (ඇමුණුම 06)

❖ ණයකරුගේ ඉල්ලීම සාධාරණව තහවුරු වන්නේ නම්, සංදේශයක් සකස් කර අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කළ යුතු ය. (ඇමුණුම 05)

❖ මුල් ණය ගිවිසුමට හානි නොවන ආකාරයට විශේෂ ගිවිසුමක් / එකඟතා ලිපියක් සමිතිය සහ ගණුදෙනුකරු අත්සන් කළ යුතු ය.

## 08. පොදු කරුණු

I. ප්‍රතිලේඛන ගත කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම අතිශයින් විචක්ෂණශීලිව ආයතනයට හානි නොවන ආකාරයට, තීරණයන් එක් එක් සිද්ධීන් අනුව පමණක් සිදු කල යුතු අතර, සෑම ණයකරුවෙකුටම සමාන කොන්දේසි මත සහන සැලසීමට වගබලා ගැනීම අධ්‍යක්ෂක මණ්ඩලයේ, සමානාධිකාරි සහ බැංකු සේවා ප්‍රධානීගේ වගකීම බව අවධාරණය කරවමි.

II. සමිති විසින් ණය ප්‍රදානය පිණිස උපයෝජනය කර ඇත්තේ සාමාජික හා සාමාජික නොවන අය සතු තැන්පතු බව සිහි තබා ගෙන ඒවා ඉල්ලු විගස අප්‍රමාදව ගෙවීම තුළින් ආයතනික ප්‍රතිරූපය පවත්වා ගැනීම පිණිස යහපත් ව්‍යාපාරික පරිචයන්ට අනුව කටයුතු කිරීම අදාල පාර්ශවයන්ගේ වගකීමක් බව සිහිපත් කරවමි.

III. ප්‍රතිලේඛණගත සහ ප්‍රතිව්‍යුහගත යෝජනා වලට කාරක සභාවේ/ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඒ අනුව ප්‍රතිලේඛණගත සහ ප්‍රතිව්‍යුහගත ගිවිසුම් සකස් කර ගැනීම සිදුකල යුතු ය.

## 09. විශේෂයෙන් සඳහන් කිරීම

ප්‍රතිලේඛන හෝ ප්‍රතිව්‍යුහගත කාර්යයන්ට ප්‍රථම මනා ලෙස සැලසුම් සහිතව ගනුදෙනුකාර විසිත්ත / පරික්ෂණක් සිදු කළ යුතු අතර මෙහිදී අතීත පරීක්ෂණ වාර්තාවල කරුණු හා නිර්දේශයන් ඇත්නම් ඒවාද සියුම්ව පරීක්ෂා කර සත්‍යතාව පිළිබඳව සෑහීමට පත්විය යුතු ය.

ඔබ සමුපකාර සමිතියෙහි / සංගමයෙහි ණය ප්‍රතිලේඛනගත කිරීම හා ප්‍රතිව්‍යුහකරණය කිරීම සඳහා මෙම චක්‍රලේඛයේ සඳහන් නියමයන්ට අනුව කටයුතු කරන මෙන් අවධාරණය කරමි.

සුචින්ද.එස්.සිංගප්පුලි,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

ඇමුණුම 01

<u>ණය මුදල් ප්‍රතිලේඛනගත කිරීමට ගණුදෙනුකරු විසින් කරනු ලබන ඉල්ලීම් ලිපි</u>

ආදර්ශ ලිපිය - 01

ජී. දුනු කුමාරි
ඩී.එම්. බණ්ඩාර
යාය 02, රඹකැන් ඔය,
නිල්ගල, මහඔය.

ග්‍රාමීය බැංකු කළමනාකාරිණී,
නිල්දියලන්ද ග්‍රාමීය බැංකුව,
සී/ස බින්තැන්න තුලාන විවිධ සේවා සමුපකාරය
පදියතලාව.

ප්‍රිය මහත්මියණී,

**2020.01.01 දින ලබාගත් කෘෂිකාර්මික ණය මුදල ගෙවීම සඳහා සහනදායී විධිවිධාන අයදුම් කිරීම ගිණුම් අංක - 2020/1**

01. ණය අංක 15/20 යටතේ මා සහ මගේ ස්වාමිපුරුෂයා විසින් ලබාගත් ණය මුදල දැනට අක්‍රමික ගණයේ පවතින හෙයින්, එය කඩිනමින් ආපසු ගෙවන ලෙස දැන් වූ ඔබගේ 2020.02.10 දිනැති ලිපියට අනුව මේ අවස්ථාවේ දී එම ණය මුදල සහ පොළිය ආපසු ගෙවීමට නොහැකි වන බව දන්වමි.

02. බඩඉරිඟු අක්කර 2.5ක් වගා කිරීම සඳහා ලබාගත් රු. 90,000 ක ණය මුදල යොදවා අදාළ වගාව සිදු කළ ද, සේනා දළඹු උවදුර නිසා එම අස්වැන්න මුළුමනින්ම විනාශ වූ බව තහවුරු කරන ප්‍රදේශයේ කෘෂි නිලධාරී මහතාගේ ලිපියක් මේ සමඟ එවමි. තවද ග්‍රාමීය බැංකුවේ ක්ෂුද්‍ර මූල්‍ය නිලධාරියා වන ඩී. ගුණරත්න මහතා 2021.02.08 දින කරන ලද පරීක්ෂණයේ දී මේ බව තහවුරු කර ගත් බව ද සිහිපත් කරවමි.

03. බඩඉරිඟු ණය මුදල ලබා ගන්නා අවස්ථාවේ දී අප වගා කර තිබූ කෙසෙල් වගාවෙන් මෙම ණය වාරික ගෙවීමට අපේක්ෂා කළ ද, 2021.01.10 දින රාත්‍රී සිදු වූ වල් අලින්ගේ ප්‍රහාරයකින් එම වගාව ද සම්පූර්ණයෙන් විනාශ වී ගිය බව වනජීවී නිලධාරීන් විසින් තහවුරු කර ඇත. වනජීවී නිලධාරීන්ගේ ලිපිය ද මේ සමඟ අමුණා ඇත.

04. මෙම ආර්ථික දුෂ්කරතා සළකා ආදී වාසීන්ගෙන් පැවත ගෙන එන අප ඉදිරි වගා කන්න තුනකින් මෙම ණය ගෙවීමට කටයුතු කරන හෙයින් එතෙක් නීතිමය කටයුතු නොකරන මෙන් ද කාරුණිකව ඉල්ලමි

05. අප ඉදිරි කාලයේ දී ණය ගෙවීමට බලාපොරොත්තු වන අකාරය

2021.09.30 දිනට පෙර රු.20,000 /=

2021.12.31 දිනට පෙර රු. 40,000/=

2022.03.31 දිනට පෙර රු. 20,000/=

2022.09.30 දිනට පෙර රු. 10,000/=

06. මෙම ණය මුදල ලබා ගත්තේ 12% ක වාර්ෂක පොළියකට බැවින් ඔබ ග්‍රාමීය බැංකුවට ලබාදිය හැකි උපරිම පොළී සහනය ද ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලමි. දැනට මහඔය ප්‍රාදේශීය සභාව විසින් අලිවැටක් ඉදිකරගෙන යන බැවින් අනාගත වගා හානි නොවනු ඇතැයි විශ්වාස කරමු.

මෙයට විශ්වාසී,

ගමරාළගේ දුනු කුමාරි

දානිගල මහබණ්ඩාර.

ආදර්ශ ලිපිය - 02

ජෙස්ටින් මේරි වැල්ලගේ

ක්‍රිස්ටි ජෝෂප් ප්‍රනාන්දු

වෙරළ පාර,

කවඩි ගම.

2021.02.10

ග්‍රාමීය බැංකු කළමනාකරු,

මුතුපන්තිය ග්‍රාමීය බැංකුව,

සලාපුර.

**ධීවර ණය මුදල ආපසු ගෙවීම සඳහා සහනයක් ඉල්ලීම. ණය අංක - 2040/03 - රු. 175,000**

1996 වර්ෂයේ සිට අප දෙදෙනා ඔබ ග්‍රාමීය බැංකුවේ ගිණුම්කරුවන් ලෙස හොඳින් ණය ආපසු ගෙවූ ගණුදෙනුකරුවන් වේ.

මා ධීවර ආම්පන්න මිලට ගැනීමට සහ ඉස්සන් වගා කිරීමට ලබාගත් ණය මුදල් ගෙවීමට අපහසු වූයේ අප සතු මා දැල් ආම්පන්න අප පොළියට ගත් ණය මුදලක් සඳහා ණය දුන් පුද්ගලයා පොළී මුදල් අත්පත් කර ගත් නිසා ය.

තවද, ඔබ බැංකුවේ ණය මුදලින් වගා කළඉස්සන්ගේ අස්වනු නෙලීමට පෙර සැල්මෙනෙල්ලා දිලීර උවදුරට ලක්වීම නිසා මුළු අස්වැන්නෙන් 75%ක් පමණ විනාශ විය. ඒ බව තහවුරු කෙරෙන ජලජීවී ප්‍රාදේශීය නිලධාරීන්ගේ 2021.02.03 ලිපිය ද මේ සමඟ එවමි.

එහෙත් අප දෙදෙනා උත්සහාවන්ත යුවලක් වන හෙයින් ධෛර්යවන්තව මෙම ණය බරින් මිදීමට හැකි උපරිම උත්සාහය දරණ අතර ඒ සඳහා සහනදායී වැඩ පිළිවෙලක් ලබාදෙන මෙන් ඉල්ලමි.

**අපගේ යෝජනාව,**

01. 2021.06.30 ට පෙර රු. 75,000ක් ගෙවීම.
02. නැවත ඉස්සන් වගා කිරීම සඳහා බීජ මිලට ගැනීමට සහ දිලීර නාශක සඳහා රු. 25,000ක නව ණය මුදලක් 2021.10.31 දිනට පෙර ලබා දීම.
03. සියළුම හිඟ ණය මුදල් ගෙවීම සඳහා පොළී සහනයක් ලබාදීම සහ දැනට එකතු වී ඇති පොළී ගෙවීම සඳහා තව ඉදිරි මාස 10ක් ලබාදීම.
04. **ණය ආපසු ගෙවීමේ වැඩපිළිවෙල,**
    - 2021.06.30 ට පෙර ගෙවන රු. 75,000/=
    - 2021.12.31 ට පෙර ගෙවන රු. 25000/=

- 2022.03.31 ට පෙර ගෙවන රු. 25,000/=
- 2022.12.31 ට පෙර ඉතිරි සියල්ල ම

05. මෙම ණය මුදලේ පොළිය 16% වන අතර එය කිසියම් ප්‍රමාණයකින් අඩු කර දෙන මෙන් ඉල්ලමි.

06. අපගේ සියළුම රන් ආභරණ ද ඔබ ග්‍රාමීය බැංකුවේ උකස් කර ඇති බව ද සලකන්න.

මෙයට විශ්වාසී,

ජෙස්ටින් මේරි වැල්ලගේ

ක්‍රිස්ටි ජෝෂප් ප්‍රනාන්දු

ආදර්ශ ලිපිය - 03

සැමසන් විමලසූරිය

ගාර්ධි පුංචි හේවාගේ මාලනී,

තොටමුණ, නුපේ පාර,

මාතර.

2021.02.12

කළමනාකාරිණී,

පොල්හේන ග්‍රාමීය බැංකුව

මාතර.

**සංචාරක කර්මාන්තයට ලබාගත් රු.100,000 ක ණය මුදල ආපසු ගෙවීමට නොහැකි වීම.**

සංචාරකයින් සඳහා නවාතැන් සැපයීමේ ව්‍යාපෘතියට ලබාගත් ණය මුදල ගෙවීමට නොහැකි වූයේ COVID 19 වසංගතය නිසා සිදු වූ සංචාරකයින්ගේ ලැඟුම්හල් වසා දැමීමට සිදු වූ නිසා ය.

දැනට අප දෙදෙනා සිල්ලර කඩයක් පවත්වාගෙන යන අතර එහි දෛනික ආදායම ණය ගෙවීම ප්‍රමාණවත් නොවේ.

තවද පසුගිය කාලයේ අපගේ සහ දරු දෙදෙනාගේ වියදම් සඳහා මුදල් පොළියට දෙන කෙනෙකුගෙන් රු. 10,000 ක අත මාරුවක් ගත් අතර දිනපතා වෙළෙඳාමෙන් ලැබෙන මුදල් ඔහු විසින් ලබා ගන්නා නිසා ණය ගෙවීමට ඉතුරුවක් නැත.

**අපගේ යෝජනාව,**

01. ණය මුදලට සකස් වූ පොළිය කපා හරින්න.
02. බිම්මල් වගාව අරඹීම සඳහා රාක්ක සවි කිරීම සහ බීජ සඳහා රු. 45,000ක නව ණය මුදලක් ලබා ගැනීම. බිම්මල් සඳහා ප්‍රදේශයේ සිල්ලර කඩවලින් දැනටමත් ඉල්ලුමක් ඇත.
03. පැරණි ණය මුදලේ ශේෂය වන රු. 75,000 සහ පොළිය තව මාස 20කට දීර්ඝ කර දීම.
04. නව ණය මුදල් ගෙවීම සඳහා සති දෙකකට වරක් රු. 2000 බැගින් තැන්පත් කිරීම.

මෙයට විශ්වාසී,

සැමසන් විමලසූරිය

ගාර්ධි පුංචි හේවාගේ මාලනී,

ඇමුණුම 02

<u>ප්‍රතිලේඛන යෝජනාවක් සඳහා ආදර්ශ ලිපිය</u>

සමිතියේ නම - සී/ස ........................................................................ සමූපකාරය සමිතිය,

ලිපිනය - ........................................................................

ග්‍රාමීය බැංකු ශාකාව - ........................................................

**රු ................................ ණය මුදල් ගෙවීම සඳහා ප්‍රතිලේඛන යෝජනාව.**

| | |
|---|---|
| ණයකරුවන් | I. ගමරාලගේ දුනු කුමාරි මිය<br>II. දානිගල මහ බණ්ඩාර මිය |
| ලිපිනය | නො. 02, රඹකැන් ඔය, නිල්ගල, මහඔය. |
| පහසුකමේ ස්වභාවය | කෙටිකාලීන කෘෂි කාර්මික ණය |
| ප්‍රදානිත දිනය | 2020.01.21 |
| ප්‍රදානිත ණය මුදල | රු. 100,000 |
| ප්‍රවර්තන ශේෂය | රු. 80,000 |
| පොළී අනුපාතය | 12% වාර්ෂික |
| ආපසු ගෙවීම | මාස 24 |
| සුරකුම් | පුද්ගලික හා සාමූහික ඇපය |
| අක්‍රමික ගණයට මාරු කිරීමේ හේතු | බඩ ඉරිඟු වගාව සේනා දළඹු උවදුරින් හානි වීම. |
| අක්‍රමික ගණයට මාරු කළ දිනය | 2021.01.10 |
| ප්‍රතිලේඛන යෝජනාව | I. ණය මුදලේ ශේෂය ගෙවීම සඳහා ඉදිරි මාස 10ක් ලබාදෙමින් ප්‍රතිලේඛනගත කිරීම.<br>II. එක්රැස් වූ පොළිය වන රු. 9750.60 ආපසු ගෙවීම සඳහා මාස 06 කාලයක් 2% පොළියට නව ණය මුදලක් ලබාදීම. |
| යෝජිත ආපසු ගෙවීම් ක්‍රමය | **ගෙවිය යුතු මුදල** — **ගෙවිය යුතු දිනය**<br>රු. 20,000 — 2021.0930 දිනට පෙර<br>රු. 40,000 — 2021.12.31 දිනට පෙර<br>රු. 20,000 — 2022.03.31 දිනට පෙර<br>රු. 9,800 — 2022.0531 දිනට පෙර |

| | |
|---|---|
| හිඟ පොළිය ගෙවීම සඳහා වන පහසුකම<br>• පොළී අනුපාතය<br>• ආපසු ගෙවීමේ මූලාශ්‍රය | 2% වාර්ෂික<br>නව බඩ ඉරිඟු වගාවෙන්<br>මහඔය ප්‍රාදේශීය සභාව විසින් අලි වැටක් ඉදි කර ගෙන යන හෙයින් ඉදිරි වගාවන්ගේ හානිය වළක්වා ගත හැකි වනු ඇත. |
| සුරැකුම් | ණය ගිවිසුම |
| කොන්දේසි | I. සතියකට වරක් රු. 500 බැගින් ඉතුරුම් ගිණුමට බැර කළ යුතු ය. මොවුන් දෙදෙනා කුලී වැඩ කර දිනකට රු. 3000ක් උපයන නිසා ඉතුරුම් අපහසුවකින් තොරව කළ හැකි බව ක්ෂුද්‍ර නිලධාරීන් තහවුරු කර ඇත.<br>II. එකඟ වූ පරිදි මුදල් නොගෙවුවහොත් යළි අක්‍රමික ණයට මාරු කර නීතිමය කටයුතු කරනු ඇත. |
| නිර්දේශය<br><br>දිනය | ..................................................<br>ග්‍රාමීය බැංකු කළමනාකාරිණී<br>..................................................<br>බැංකු සේවා කලමනාකාරිණී<br>..................................................<br>ණය අනු කමිටුව<br>..................................................<br>අධ්‍යක්ෂ මණ්ඩලය |

ඇමුණුම 03

<u>ආදර්ශ ප්‍රතිලේඛණගත කිරීමේ ගිවිසුම</u>

පොරොන්දු ගිවිසුම් පත්‍රයයි.

සියලු දෙනාම මෙයින් දැනගත යුතුය.

මෙහි පළමු පාර්ශවය යැයි කියනු ලබන 1983 අංක 32 හා 1992 අංක 11 දරණ පනත් වලින් සංශෝධිත1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත යටතේ විධිමත් ලෙස ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් වන .......................................... තැපැල් ...................................................................... යන ලිපිනයේ සිය කාර්යාල පවත්වාගෙන යන සීමා සහිත/රහිත .................................................................................................. සමුපකාර සමිතිය එක් පක්ෂයකට ද,

මෙහි පහත දෙවන පාර්ශවය යැයි කියනු ලබන ...................................................... තැපැල් ................................................................................ යන ලිපිනයේ ................................................................................ (ජා.හැ.අංක ..................................................) අනෙක් පක්ෂයකට ද බැදී වර්ෂ ............................................................................................ දින ............................................................... දී ඒ දෙපක්ෂය අතරේ ඇති කරගන්නා පොරොන්දු ගිවිසුම් පත්‍රයයි.

ඉහත කී දෙවන පාර්ශවය පළමු පාර්ශවය වෙතින්.................................................................... දිනැති අංක ........................................... දරන ණය ගිවිසුම යටතේ වසරකට සියයට ......................................(...........%) බැගින් පොලිය සහ යම් දඩ මුදලක් වේ නම් ඒ දඩ පොලියද සමග මුලු මුදල වසර ............................. (............) කින් ගෙවා අවසන් කිරීමේ පොරොන්දුව යටතේ ලබා ගෙන ඇති රුපියල් ....................................................................... (රු. .......................................) ක ණය මුදලේ වසරකට පොලී ප්‍රතිශතය / සහ ගෙවා අවසන් කළ යුතු කාළ සීමාව පහත සදහන් පොරොන්දු හා ගිවිසුම් වලට යටත් දීර්ඝ කර දීමට හා දීර්ඝ කර ගැනීමට ඒ දෙපාර්ශවය එකඟ වේ.

ඉහත කී පොරොන්දු ගිවිසිලි කවරේද යත්,

1. මෙම ගිවිසුම් ..................................... දිනෙන් ආරම්භ වී ................................. දිනෙන් අවසන් වේ.
2. ඉහත කී දෙවන පාර්ශවය , පළමු පාර්ශවය වෙතින් ......................................................දිනැති ..................................................අංක දරණ ණය ගිවිසුම යටතේ වසරකට සියයට .........................................(.................%) බැගින් පොලිය සහ යම් දඩ මුදලක් වේ නම් ඒ දඩ පොලියද සමග මුලු මුදල වසර ........................................................ (............) කින් ගෙවා අවසන් කිරීමේ පොරොන්දුව රුපියල් ................................................................................ (රු. ...............................................) ක ණය මුදලක් ලබා ගෙන ඇති බව දෙවන පාර්ශවය පිළිගනී.

3. ඒකී ණය මුදලට අදාළව .............................................................................. ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ............................................................ දිනැතිව අංක ......................... දරන ණය උගස්කරය පළමු පාර්ශවය නමින් ලියා සහතික කර ඇති බවට දෙවන පාර්ශවය පිළිගනී.

4. එකී රුපියල් ................................................................ (රු. ...................................) ක ණය මුදලේ අද දිනට එනම් ......................................................... දිනට තව දුරටත් ගෙවිය යුතුව ඇති ණය ශේෂය රුපියල් .............................................................................................(රු. ....................................) බවද, ගෙවිය යුතුව ඇති පොලිය රුපියල් ...................................................................................... (රු. ....................................) බවද ගෙවිය යුතු මුලු මුදල රුපියල් ..................................................................................(රු. .........................................................) ක් බවද දෙවන පාර්ශවය පිළිගනී.

5. ඉහත දෙවන (2) ඡේදයෙහි සඳහන් ණය මුදල මාසික වාරික වලින් ගෙවා අවසන් කලයුතු කාලසීමාව ............................................... දිනෙන් අවසන් වන අතර එකී කාලසීමාව එතැන් සිට තවත් වසර .............................................. (................) කින් එනම් ...................................... දින දක්වා දීර්ඝකර දීමට පළමු පාර්ශවය එකඟ වේ.

6. ඉහත පස්වන (5) ඡේදයේ සඳහන් පරිදි අද දින පටන් දීර්ඝ කරන කාලය එනම් ......................................... දින දක්වා කාලය තුළ අදාළ පොළියද සමග ණය මුදලේ මාසික වාරිකය වශයෙන් රුපියල් ............................................................................................(රු. ...............................) ක් මාසිකව ගෙවා අවසන් කළ යුතු අතර දෙවන පාර්ශවය ඊට එකඟ වේ.

7. ඉහත හතර (4) වන ඡේදයෙහි සඳහන් ................................................ දින සිට .......................................... දින දක්වා අයවිය යුතු පොළිය රුපියල් ........................................................................................ (රු. ..............................) ක මුදල .......................................... දින සිට ..........................................දින දක්වා රුපියල් ................................................................... (රු. ........................) බැගින් මාසිකව ගෙවා අවසන් කළ යුතු අතර දෙවන පාර්ශවය ඊට එකඟ වේ.

8. කුමන හේතුවක් මත හෝ කුමන අවස්ථාවකදී හෝ දෙවන පාර්ශවය මෙම පොරොන්දු ගිවිසුමේ යම් විධානයක් කඩ කරනු ලැබුවහොත් මෙම පොරොන්දු ගිවිසුමේ දෙවන (2) ඡේදයේ සඳහන් ............................................................................................ තැන විසින් ............................................දිනැතිව ලියා සහතික කරන ලද අංක .......................................... දරණ ණය උගස්කරය මත ණය අය කර ගැනීමට පළමු පාර්ශවයට ඇති අයිතිය දෙවන පාර්ශවය පිළිගනී.

තවද ඉහත සඳහන් පොරොන්දු හරිආකාරව ඉෂ්ඨ කිරීම පිණිස ඉහත කී පළමු පාර්ශවය වෙනුවෙන් එහි මුද්‍රාව තබා එහි සභාපති .................................................... තැපැල් ....................................................... යන ලිපිනයේ පදිංචි .............................................................................................. එහි ලේකම් ....................................................................................... යන ලිපිනයේ පදිංචි

........................................................................................................................සහ දෙවන පාර්ශවයේ
........................................................................................................................වන අප වර්ෂ
....................................................................... වූ .................................................... මස
...........................................................................................දින දී අප අපගේ අත්සන තබා සහතික කරමු.

....................................................

පළමු පාර්ශවය

....................................................

දෙවන පාර්ශවය

සාක්ෂි-

1. නම - ................................................................ අත්සන - .......................................
2. නම - ................................................................ අත්සන - .......................................

ඇමුණුම 04

<u>ණය මුදල් ප්‍රතිව්‍යුහගත කිරීමට ගණුදෙනුකරු විසින් කරනු ලබන ඉල්ලීම් ලිපියක්</u>

ආදර්ශ ලිපිය - 04

අමල් සංජීව සකලසූරිය,

එලුවාපොල,

වැවගම.

2020.12.28

කලමනාකාරිණි,

වැවගම ග්‍රාමීය බැංකුව,

වැවගම.

නිවාස අලුත්වැඩියාව සඳහා ලබාගත් රු.100,000 ක ණය මුදල ආපසු ගෙවීමට නොහැකි වීම.

මාගේ නිවස අලුත්වැඩියා කිරීම සඳහා මා විසින් ලබාගත් ණය මුදල වාරික 04 ක් ගෙවීමට නොහැකි වූයේ COVID 19 වසංගතය නිසා මා රැකියාව සිදුකල ව්‍යාපාරික ස්ථානය වසා දැමීමට සිදු වූ බැවිනි.

දැනට මා වෙනත් ව්‍යාපාරික ස්ථානයක රැකියාවක නිරත වන අතර පෙර රැකියාව සිදුකල ස්ථානයේ මෙන් අතිකාල රාජකාරි කිරීමට අවස්ථාවක් ද නොමැත.

තවද පසුගිය කාලයේ අපගේ සහ දරු දෙදෙනාගේ වියදම් සඳහා මුදල් පොළියට දෙන කෙනෙකුගෙන් රු. 50,000 ක අත මාරුවක් ගත් අතර එම මුදලද මා දැනට ලබන වැටුපෙන් ගෙවීමට සිදු වී ඇති බැවින් ඔබ ආයතනයේ ණය ගෙවීමට අපහසු වී ඇත.

අපගේ යෝජනාව,

01. ණය මුදල සඳහා මූල්‍ය වෙළඳපොළේ වර්තමාන ණය පොළී ප්‍රතිශතය සලකා පොළී ප්‍රතිශතය අඩු කර දෙන ලෙසට,

02. ණය මුදල ගෙවීමේ කාලසීමාව තවත් වසරකින් දීර්ඝ කර දෙන ලෙසට ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසි,

අමල් සංජීව සකලසූරිය,

ඇමුණුම 05

<u>ප්‍රතිව්‍යුහගත යෝජනාවක් සඳහා ආදර්ශ ලිපිය</u>

බැංකු සේවා ප්‍රධානි මඟින්,

සාමාන්‍යාධිකාරීමඟින්,

අධ්‍යක්ෂක මණ්ඩලය.

දිනය ..........................  යොමුව ............................

......................................................... මහතාට/ මියට/මෙනවියට ප්‍රදානය රු.

.......................................ණය මුදල ප්‍රති ව්‍යුහගත කිරීමේ යෝජනාව

පහත සඳහන් ප්‍රතිව්‍යුහකරණ යෝජනා පිළිබඳව අපගේ අදහස් සහ නිරීක්ෂණයන් මතු දක්වමින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමු.

01.ණයකරු - අමල් සංජීව සකලසූරිය

02. ලිපිනය - එලුවාපොල, වැවගම

03. ලබාගත් ණයමුදල - රු 100,000 /=

04. ලබාගත් දිනය - 2020.01.23

05. වාරිකය - රු. 3000/= x 33 + 1000

06. යෝජනාව - මෙම ණය මුදල ලබා ගෙන ඇත්තේ ණයකරුගේ නිවස අලුත්වැඩියා කිරීම සඳහා ය. එහෙත් කොවිඩ් -19 වසංගතය හේතුවෙන් ඔහුගේ රැකියාව අහිමි වී ඇති අතර මාස 06 කට පසුව නැවත වෙනත් රැකියාවක නිරතව සිටින බව තහවුරු කරගෙන ඇත. රැකියාවක් නොමැතිව සිටි කාලය තුළ ණය වාරික 04 ක් ගෙවීම අතපසු වී ඇත. එම කාලයේ ඔහුගේ ණයගැතිභාවය තවදුරටත් ඉහලගොස් ඇති බව තහවුරු වී ඇති අතර මෙම ණය වාරිකය හා පොළිය ගෙවීමට අපහසු බවද සඳහන් කර ඇත. ඒ අනුව ණය ගෙවා අවසන් කිරීමේ කාලය වසරකින් දීර්ඝ කර දෙන ලෙසත් පොළී අනුපාතය 8% දක්වා අඩු කරන ලෙසත් 2021.03.20 දින ණයකරු විසින් ඉල්ලා ඇත.

ඔහුගේ වර්ථමාන ආර්ථික ශක්‍යතාවය සැලකීමේදී ණය ගෙවා අවසන්කිරීමේ කාලය වසරකින් දීර්ඝ කිරීම සුදුසු බවත් තැන්පත් පොළි අනුපාත ද පහත දමා ඇති බැවින් ණය පොළී අනුපාතය 9% ක් දක්වා පහත හෙළීම සුදුසු බව යෝජනා කරමි.

හෝ

**ස්වයංරැකියාවක් හෝ ව්‍යාපෘතියක් සඳහා ලබාගෙන ඇති ණයක් නම්,**

ණය වාරිකය අඩු කිරීම කළ හැකි වුවත් පොළී අනුපාතය අඩු කළ නොහැකි බවට 2021.03.23 දින කරන ලද සාකච්ඡාවේ දී පිළිගත් අතර මේ අනුව පහත සඳහන් අයුරු ණය මුදල ප්‍රතිව්‍යුහගත කිරීම යෝජනා කරමි.

ආපසු ගෙවීම් ක්‍රමය -

I.මාසිකව රු. 500/= බැගින් වාරික 30 ක්ද මාසිකව රු. 1000/= බැගින් ඉතිරි වාරික සියල්ලද වාර්ෂිකව 8% බැගින් පොළියද ගෙවිය යුතු ය.

(१९)

II.කිසිදු වාරිකයක් හිඟ නොකළ යුතු අතර 2021.12.31 දින වන විට වෙළෙඳපොළ යථා තත්ත්වයට පත්වුවහොත් නැවත ණය වාරිකය ගැලපිය යුතු ය.

III.ණය ගෙවා අවසන් වන තෙක් ව්‍යාපාරයේ මාසික වියදම සහ ආදායම පිළිබඳ වාර්තාවක් බැංකු අංශය වෙත නිකුත් කළ යුතු ය.

IV.ව්‍යාපාරයේ දෛනික ආදායම් සතියකට වරක් බැංකුවේ තැම්පත් කළ යුතු ය.

V.ව්‍යාපාරයේ ගිණුම් පොත් අඛණ්ඩව ලියා තැබිය යුතු අතර ග්‍රාමීය බැංකු නිලධාරීන්ට අවශ්‍ය වූ විට පරීක්ෂාව සඳහා ඉදිරිපත් කළ යුතු ය.

.......................................

ග්‍රාමීය බැංකු කළමණාකරු

ප්‍රතිව්‍යුහකරණ යෝජනා නිර්දේශගතකරණය

ඉහත ප්‍රතිව්‍යුහකරණ යෝජනා නිර්දේශ කරමු.

| | බැංකු සේවා ප්‍රධානි | සාමාන්‍යාධිකාරී |
|---|---|---|
| දිනය ......................... | ............................... | ............................ |

ඇමුණුම 06

<u>ප්‍රතිලේඛන / ප්‍රතිව්‍යුගතකරණය පිළිබඳ අවශ්‍යතාව සහ යෝජනාවේ සත්‍යතාව අධ්‍යයනය කිරීමේ පරීක්ෂණය.</u>

1. ණයකරුගේ නම, ලිපිනය, හැඳුනුම්පත් අංකය
2. ණය මුදල, අවශ්‍යතාවය, පොළී අනුපාතය
3. යෝජනාව
4. වත්මන් තත්ත්වය
    - 4.1. ව්‍යාපාරයේ ක්‍රියාත්මක බව
    - 4.2. ආදායම්, වියදම්, වත්කම්, වගකීම්
    - 4.3. වාරික නොගෙවීමට හේතුව
    - 4.4. අනාගත අපේක්ෂාවන් සැලසුම්
5. ඉදිරි මූල්‍ය ප්‍රභවය
6. කොන්දේසි හා නියමයන්
7. නිර්දේශ
8. පරීක්ෂණ දිනය
9. පරීක්ෂණ නිළධාරියාගේ නම
10. නිලධාරී අත්සන, තනතුර හා දිනය

ඇමුණුම 07

<u>ප්‍රතිව්‍යුහගත ගිවිසුමක ආදර්ශයක්</u>

**පොරොන්දු ගිවිසුම් පත්‍රයයි.**

**සියලු දෙනාම මෙයින් දැනගත යුතුය.**

මෙහි පළමු පාර්ශවය යැයි කියනු ලබන 1983 අංක 32 හා 1992 අංක 11 දරණ පනත් වලින් සංශෝධිත1972 අංක 5 දරණ සමුපකාර සමිති පනත යටතේ විධිමත් ලෙස ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් වන .......................................... තැපැල් .................................................................... යන ලිපිනයේ සිය කාර්යාල පවත්වාගෙන යන සීමා සහිත/රහිත ........................................................................................................ සමුපකාර සමිතිය එක් පක්ෂයකට ද,

මෙහි පහත දෙවන පාර්ශවය යැයි කියනු ලබන ...................................................... තැපැල් ........................................................................... යන ලිපිනයේ ........................................................................... (ජා.හැ.අංක ...................................................) අනෙක් පක්ෂයකට ද බැදී වර්ෂ .................................................................................................... දින ................................................................ දී ඒ දෙපක්ෂය අතරේ ඇති කරගන්නා පොරොන්දු ගිවිසුම් පත්‍රයයි.

ඉහත කී දෙවන පාර්ශවය පළමු පාර්ශවය වෙතින්..................................................................... දිනැති අංක ........................................ දරන ණය ගිවිසුම යටතේ වසරකට සියයට .......................................(...........%) බැගින් පොලිය සහ යම් දඩ මුදලක් වේ නම් ඒ දඩ පොලියද සමග මුලු මුදල වසර .............................. (............) කින් ගෙවා අවසන් කිරීමේ පොරොන්දුව යටතේ ලබා ගෙන ඇති රුපියල් .......................................................................... (රු. ......................................) ක ණය මුදලේ වසරකට පොලී ප්‍රතිශතය / සහ ගෙවා අවසන් කළ යුතු කාළ සීමාව පහත සදහන් පොරොන්දු හා ගිවිසුම් වලට යටත් දීර්ඝ කර දීමට හා දීර්ඝ කර ගැනීමට ඒ දෙපාර්ශවය එකඟ වේ.

ඉහත කී පොරොන්දු ගිවිසිලි කවරේද යත්,

3. මෙම ගිවිසුම් .................................... දිනෙන් ආරම්භ වී ................................. දිනෙන් අවසන් වේ.
4. ඉහත කී දෙවන පාර්ශවය , පළමු පාර්ශවය වෙතින් ......................................................දිනැති ..............................................අංක දරණ ණය ගිවිසුම යටතේ වසරකට සියයට ....................................(.................%) බැගින් පොලිය සහ යම් දඩ මුදලක් වේ නම් ඒ දඩ පොලියද සමග මුලු මුදල වසර ................................................... (............) කින් ගෙවා අවසන් කිරීමේ පොරොන්දුව රුපියල් ............................................................................ (රු. ..............................................) ක ණය මුදලක් ලබා ගෙන ඇති බව දෙවන පාර්ශවය පිළිගනී.
5. ඒකී ණය මුදලට අදාළව ..................................................................... ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ........................................................ දිනැතිව අංක .......................... දරන ණය උගස්කරය පළමු පාර්ශවය නමින් ලියා සහතික කර ඇති බවට දෙවන පාර්ශවය පිළිගනී.

6. එකී රුපියල් ........................................................ (රු. ...........) ක ණය මුදලේ අද දිනට එනම් .......................................... දිනට තව දුරටත් ගෙවිය යුතුව ඇති ණය ශේෂය රුපියල් ........................................................(රු. .................) බවද, ගෙවිය යුතුව ඇති පොලිය රුපියල් ........................................................ (රු. ..................) බවද ගෙවිය යුතු මුලු මුදල රුපියල් ...........................................................(රු. ....................) ක් බවද දෙවන පාර්ශවය පිළිගනී.

7. එකී ණය මුදල සඳහා වාර්ෂික පොළී අනුපාතිකය අද දින සිට සියයට .................. (..........%) ක් ලෙස වසර දෙකක් දක්වාද ඉන් පසුව මූල්‍ය වෙළඳපොළේ සිදුවන පොළී අනුපාතවල ඉහලයාම් සලකා සමිතිය / සංගමයේ පොළී අනුපාත ඉහලදැමීම මත මුල් ගිවිසුමේ පොළී අනුපාතය දක්වා ඉහල දැමීමට දෙවන පාර්ශවය එකඟ වේ.

8. ඉහත දෙවන (2) ඡේදයෙහි සඳහන් ණය මුදල මාසික වාරික වලින් ගෙවා අවසන් කලයුතු කාලසීමාව ............................................... දිනෙන් අවසන් වන අතර එකී කාලසීමාව එතැන් සිට තවත් වසර ................................................ (................) කින් එනම් ...................................... දින දක්වා දීර්ඝකර දීමට පළමු පාර්ශවය එකඟ වේ.

9. ඉහත පස්වන (5) ඡේදයේ සඳහන් පරිදි අද දින පටන් දීර්ඝ කරන කාලය එනම් ............................................ දින දක්වා කාලය තුළ අදාළ පොළියද සමග ණය මුදලේ මාසික වාරිකය වශයෙන් රුපියල් .......................................................................(රු. ...............................) ක් මාසිකව ගෙවා අවසන් කළ යුතු අතර දෙවන පාර්ශවය ඊට එකඟ වේ.

10. කුමන හේතුවක මත හෝ කුමන අවස්ථාවකදී හෝ දෙවන පාර්ශවය මෙම පොරොන්දු ගිවිසුමේ යම් විධානයක් කඩ කරනු ලැබුවහොත් මෙම පොරොන්දු ගිවිසුමේ දෙවන (2) ඡේදයේ සඳහන් ....................................................................... තැන විසින් ................................................දිනැතිව ලියා සහතික කරන ලද අංක ........................................ දරන ණය උගස්කරය මත ණය අය කර ගැනීමට පළමු පාර්ශවයට ඇති අයිතිය දෙවන පාර්ශවය පිළිගනී.

තවද ඉහත සඳහන් පොරොන්දු හරි ආකාරව ඉෂ්ඨ කිරීම පිණිස ඉහත කී පළමු පාර්ශවය වෙනුවෙන් එහි මුද්‍රාව තබා එහි සභාපති ........................................................ තැපැල් ........................................................ යන ලිපිනයේ පදිංචි ................................................................................ එහි ලේකම් .................................................................... යන ලිපිනයේ පදිංචි ........................................................ සහ දෙවන පාර්ශවයේ ....................................................................වන අප වර්ෂ ......................... වූ ............................. මස ..................................දින දී අප අපගේ අත්සන තබා සහතික කරමු.

..................................................

පළමු පාර්ශවය

....................................................

දෙවන පාර්ශවය

සාක්ෂි-

1. නම - ............................................................ අත්සන - ....................................

නම - ............................................................ අත්සන - ....................................